සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

නිවාඩු කාලීන පැවරුම්

විෂය සමගාමී ක්‍රියාකාරකම්

විශයය - පරිසරය

අගෝස්තු - 4 සතිය

සැකසුම - D .A. චම්පිකා දේවනාරායන

කෑ/දෙහි/ඉඹුලාන ශ්‍රී සේන මහා විද්‍යාලය

---

# <u>බල්ලා සහ කපුටන්</u>

ආදරණීය දුවේ පුතේ , මෙම සෙල්ලමට ඔබේ සහෝදර සහෝදරයන්, අවට යහළුවන් සහභාගී කරගන්න.

මිදුලේ දෙකෙළවර තරමක් දුරින් රේඛා දෙකක් සමාන පරතර ඇතිව අදින්න. ( සමාන්තරව )එක රේඛාවක සමාන පරතර ඇතිව කෝටු කැබලි රාශියක් ( ඔබ කැමති සංඛ්‍යාවක් ) තබන්න. ( ඒවා මස්කටු ලෙස සිතමු. ) ඒවා රැකීමට එම රේඛාවේ කෙලවර එක් ළමයෙකු සිටිය යුතුය. එම ළමයා බල්ලාය.

අනෙක් රේඛාවේ සිටින්නේ කපුටන්ය. අණක්ලැබුනු විගස ( “ඉගිලෙන්න” යනුවෙන් කෙනෙකු අනක් දිය යුතුය ) කපුටන් “කාක්” “ කාක්” කියමින් මස් කටු ඩැහැ ගැනීමට දුව ගොස් මාන බලයි. එක්වරම බල්ලා කපුටන්ට පහර දෙන්නට පැමිණෙයි. බල්ලාගෙන් පහර් නොකා වැඩිපුර මස් කටු ඩැහැ ගත් කෙනා ජයග්‍රාහකයා වෙයි. බල්ලාගෙන් පහර කෑ කෙනා බල්ලා වී නැවතත් විනෝද ක්‍රීඩාවේ යෙදෙන්න.

ඔබට සුවබර සතියක් මෙවැනි විනෝදජනක සෙල්ලමකින් නැවත හමුවෙමු........!